ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ

සුරාබදු සැරයන් තනතුරට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2021 හා 2022 (2023)

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක/කෝප්‍රල් හා කාන්තා නියාමක නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටියේ 10.2.2.2. හි 10.2.2.2.1 ඡේද වල විධිවිධාන පරිදි සුරාබදු සැරයන් තනතුරු 30ක් (තිහක්) සීමිත තරග විභාගය මත උසස් කිරීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුරාබදු සැරයන් තනතුරට සීමිත තරග විභාගය මත උසස් කිරීම.

සුරාබදු සැරයන් තනතුරට සීමිත පදනම මත උසස් කිරීම සඳහා 2021 හා 2022 වර්ෂයට අදාළව සැරයන් තනතුරු 30ක් (තිහක්) පුරප්පාඩුව පවති. ඉන් 2021.01.20 දිනට පුරප්පාඩුව පවතින තනතුරු 8ක් සහ 2022.10.21 දිනට පුරප්පාඩුව පවතින තනතුරු 22ක් සඳහා ද එකම විභාගයක් පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව කටයුතු කරනු ලැබේ. එහිදී පළමුව 2021 වසරට අදාළ පුරප්පාඩු 8 සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා එම පුරප්පාඩු සම්පූර්ණ කර පත්වීම් ලබාදීමෙන් අනතුරුව 2022 වසරට අදාළ පුරප්පාඩු සඳහා දෙවනුව සුදුසුකම්ලත් නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා එම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

1. **සපුරාලිය යුතු සුදුසුකම්**

I. සුරාබදු නියාමක/ කෝප්‍රල් තනතුරේ ස්ථිර කර තිබීම.
II. සුරාබදු නියාමක/ කෝප්‍රල් තනතුරෙහි අවම වශයෙන් වසර අටක් (08) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අවම වශයෙන් යහපත් කල්ක්‍රියා ලාංඡන දෙකක් (02) ලබා තිබීම.
VI. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
VII. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

2. **සීමිත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණය**

බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලිඛිත විභාගය පහත පරිදි ප්‍රශ්න පත්‍ර 02කින් යුක්ත වේ.

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
1. සුරාබදු නීතිය හා දෙපාර්තමේන්තු නියෝග	පැය 03	100	40%
2. පොදු ප්‍රශ්න පත්‍රය	පැය 02	100	40%

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
1. සුරාබදු නීතිය හා දෙපාර්තමේන්තු නියෝග	1. සුරාබදු ආඥාපනත, දුම්කොළ බදු පනත, වස විෂ අබිං හා අන්තරායදායක ඖෂධ පනත පිළිබඳ දැනුම 2. දෙපාර්තමේන්තු නියෝග පිළිබඳ දැනුම 3. සුරාබදු අත්පොත පිළිබඳ දැනුම
2. පොදු ප්‍රශ්න පත්‍රය	1. දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු රැස්කිරීම, වාර්තා සකස් කිරීම, සංඛ්‍යානමය තොරතුරු පවත්වාගෙන යාම. 2. රා එකතු කිරීමේ හා මත්පැන් නිෂ්පාදන බලපත්‍ර ලත් ස්ථානවල තොග හා මුදල් ගණන් බැලීම ආදියට අවශ්‍ය ගණිතමය දැනුම 3. භූගෝලීය, සමාජීය හා ආර්ථික පරිසරය 4. රාජකාරීමය පොදු දැනුම සහ දෙපාර්තමේන්තුවේ උන්නතියට අදාළව කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ උපක්‍රම

3. **<u>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:</u>**

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
සේවා පළපුරුද්ද	20	අදාළ නොවේ
කාර්ය සාධන ඇගයීම්	20	
ලබා ඇති සාධු සටහන් ➢ පූර්වාසන්න වසර පහ (05) තුළ විශේෂ සාධු සටහන් - 05 ➢ සාමාන්‍ය සාධු සටහන් - 03	30	
ලාංජන ලබා තිබේ නම් (පලාවන් 3- ලකුණු 01, රතු 1- ලකුණු 02, රතු 2- ලකුණු 03, රතු 3- ලකුණු 4, රන්වන්- ලකුණු 05)	05	
තනතුරට අදාළ පුහුණුවීම්	10	
උසස් අධ්‍යාපන සුදුසුකම් (ඩිප්ලෝමා- ලකුණු 05, පැය 60ට වැඩි සහතික පත්‍ර පාඨමාලා- ලකුණු 03)	05	
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව	10	
එකතුව	**100**	

4. **<u>උසස් කිරීමේ ක්‍රමය:</u>**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත 2 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ලිඛිත විභාගයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර ලිඛිත විභාගය සමත් වන අය අතරින් උසස් කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුරාබදු සැරයන් තනතුරට උසස් කරනු ලැබේ. එසේ වුව ද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට තීරණයක් ගත හැකිය.

විභාග දිනය - මෙම විභාගය 2024 මාර්තු මස කොළඹදී පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානයකදී පැවැත්වෙනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට බලයක් ඇත.

විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් වන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5. **වැඩ බලන කාලය**

සුරාබදු සැරයන් තනතුරට උසස් කරනු ලබන නිලධාරීන් අවුරුද්දක වැඩ බලන කාලයකට යටත් කොට පත් කරනු ලැබේ. වැඩ බලන කාලපරිච්ඡේදයේදී රැකියාවට අදාළ යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරමින් හා කාර්යක්ෂම ලෙස සේවය කරමින් ද යහපත් හැසිරීමෙන් ද යුක්ත වී නම් වැඩ බැලීමේ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කරනු ලැබේ.

6. **කාර්යක්ෂමතා කඩඉම**

සුරාබදු නියාමක තනතුරට බඳවාගෙන වසර 10ක් හෝ සුරාබදු සැරයන් තනතුරට උසස්වී වසර 03ක් හෝ යන දෙකෙන් පළමුව යෙදෙන කාලසීමාව තුළ දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

7. **වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සුරාබදු සැරයන් තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය (RS 2 – 2016) රු. 32,010-9x370-17x 495-43755/-ක් වේ.

8. **අයදුම්කිරීමේ ක්‍රමය**

අයදුම්පත් මාර්ගගතව පමණක් භාරගනු ලැබේ. මාර්ගගත (online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න, අයදුම්පත සම්පූර්ණ කිරීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න.

(i) ඉහත 1 හි සඳහන් සුදුසුකම් 2021.01.20 දිනට සම්පූර්ණ කරන නිලධාරීන් අංක 1 වරණය තෝරාගත යුතුවේ.

(ii) ඉහත 1 හි සඳහන් සුදුසුකම් 2022.10.21 දිනට සම්පූර්ණ කරන නිලධාරීන් අංක 2 වරණය තෝරාගත යුතුවේ.

(iii) 2021 හා 2022 වර්ෂ දෙකේම පුරප්පාඩු යටතේ ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් අංක 3 වරණය තෝරාගත යුතුය.

විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

9. විභාග ගාස්තු රු.1200/-කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය. සැ.යු. - ඉහත 8 (iii) හි අපේක්ෂකයින් ද එක් විභාග ගාස්තුවක් පමණක් ගෙවීම ප්‍රමාණවත්ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Cards)
II. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Cards)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

අයදුම්පත් භාරගැනීම 2024 ජනවාරි 01 දින සිට 2024 ජනවාරි 31 දින මධ්‍යම රාත්‍රී 12.00 තෙක් සිදුකෙරේ. ඉදිරිපත් කළ අයදුම්පතේ යම් සංශෝධනයක් සිදුකිරීමට අවශ්‍ය වන්නේ නම් අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට දින තුනක කාලයක් ඒ සඳහා මාර්ගගත පහසුකම් සලසනු ලැබේ.

සටහන:- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

10. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ පිළිබඳව නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

11. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් පත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වේ.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

ජේ.එම්.එස්.එන්. [illegible]
සුරාබදු කොමසාරිස් [illegible]
ශ්‍රී ලංකා සුරාබදු [illegible]
කොළඹ, [illegible], කොළඹ [illegible], රජරට.

மதுவரித் திணைக்களம், இலங்கை

மதுவரி சார்ஜன் பதவி உயர்வுக்கான மட்டுப்படுத்தப்பட்ட போட்டிப்பரீட்சை -2021 மற்றும் 2022(2023)

மதுவரித் திணைக்களத்தில் மதுவரிக் காவலர்/ கோப்ரல்கள் மற்றும் மகளிர் காவலர் உத்தியோகத்தர்களை ஆட்சேர்ப்பு செய்வதற்கான நடைமுறையின் 10.2.2.2. மற்றும் 10.2.2.2.1 பந்திகளின் ஏற்பாடுகளின் பிரகாரம் மட்டுப்படுத்தப்பட்ட போட்டிப்பரீட்சை அடிப்படையில் 30 (30) மதுவரி சார்ஜன் பதவிகளுக்கு பதவி உயர்வுக்கான விண்ணப்பங்கள் கோரப்படுகின்றன.

மதுவரி சார்ஜன் பதவிக்கு மட்டுப்படுத்தப்பட்ட போட்டிப்பரீட்சை மூலமான பதவி உயர்வு

மட்டுப்படுத்தப்பட்ட அடிப்படையில் மதுவரி சார்ஜன் பதவிக்கு பதவி உயர்வு பெறுவதற்காக 2021 மற்றும் 2022 ஆம் ஆண்டுகளில் 30 (முப்பது) சார்ஜன் பதவிகள் வெற்றிடமாக உள்ளன. அரசாங்க சேவை ஆணைக்குழுவின் அங்கீகாரத்திற்கிணங்க 20.01.2021 இல் உள்ள 8 வெற்றிடங்களுக்கும், 21.10.2022 இல் உள்ள 22 வெற்றிடங்களுக்கும் ஒரே பரீட்சை நடாத்தப்படும். அதன்போது, 2021ஆம் ஆண்டுடன் தொடர்புடைய 8 வெற்றிடங்களுக்கும் தகுதியான உத்தியோகத்தர்கள் நேர்முகப் பரீட்சைக்கு முதலில் அழைக்கப்பட்டு, அந்த வெற்றிடங்கள் நிரப்பப்பட்டு நியமனங்கள் வழங்கப்படும். பின்னர் 2022ஆம் ஆண்டுடன் தொடர்புடைய வெற்றிடங்களுக்குத் தகுதியான உத்தியோகத்தர்கள் இரண்டாவதாக நேர்முகப் பரீட்சைக்கு அழைக்கப்பட்டு வெற்றிடங்கள் நிரப்பப்பட்டு நியமனம் வழங்கப்படும்.

1. **பூர்த்தி செய்ய வேண்டிய தகமைகள்**

   I. மதுவரி காவலர்/ கோப்ரல் பதவியில் உறுதிப்படுத்தப்பட்டிருத்தல்
   II. மதுவரி காவலர் / கோப்ரல் பதவியில் குறைந்தது எட்டு (08) ஆண்டுகள் முனைப்பான மற்றும் திருப்திகரமான சேவையை பூர்த்தி செய்திருத்தல்.
   III. அங்கீகரிக்கப்பட்ட செயலாற்றுகை நடைமுறைக்கிணங்க முந்தைய ஐந்து (05) வருடங்களில் திருப்திகரமான அல்லது அதற்கு மேலான செயலாற்றுகையை வெளிப்படுத்தியிருத்தல்
   IV. பதவியுயர்வுத் தினத்திற்கு முன்னரான ஐந்து (05) வருடங்களுக்குள் திருப்திகரமான சேவைக் காலத்தை நிறைவு செய்திருத்தல்.
   V. குறைந்தபட்சம் இரண்டு(02) நன்நடத்தைக்கான இலட்சினைகளை பெற்றிருத்தல்.
   VI. குறிப்பிட்ட திகதிக்குள் இரண்டாவது வினைத்திறன் தடைகாண் பரீட்சையில் சித்தி பெற்றிருத்தல்.
   VII. உரிய மட்டத்திற்கான ஏனைய அரசகரும மொழிகளில் புலமை பெற்றிருக்க வேண்டும்.

2. **மட்டுப்படுத்தப்பட்ட போட்டிப்பரீட்சைக்கான எழுத்துப் பரீட்சை**

ஆட்சேர்ப்பு நடைமுறையின் படி எழுத்துப் பரீட்சை பின்வரும் 02 வினாத்தாள்களைக் கொண்டுள்ளது.

வினாத்தாள்	காலம்	மொத்த புள்ளிகள்	சித்தி பெறுவதற்கான புள்ளி
1. மதுவரி சட்டங்களும் திணைக்களக் கட்டளைகளும்	03 மணி	100	40 %
2. பொது வினாத்தாள்	02 மணி	100	40%

வினாத்தாளின் பெயர்	விடயப் பரப்பு
1. மதுவரி சட்டங்களும் திணைக்களக் கட்டளைகளும்	1. மதுவரி கட்டளைச் சட்டம், புகையிலை வரிச் சட்டம், நஞ்சு, அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் கட்டளைச் சட்டம் பற்றிய அறிவு 2. திணைக்களக் கட்டளைகள் பற்றிய அறிவு 3. மதுவரி கையேடு பற்றிய அறிவு
2. பொது வினாத்தாள்	1. திணைக்களம் தொடர்பான தகவல்களைச் சேகரித்தல், அறிக்கைகளைத் தயாரித்தல், புள்ளிவிபரத் தகவல்களைப் பேணுதல். 2. மதுபானம் சேகரிப்பு மற்றும் மதுபானம் தயாரிக்கும் உரிமம் பெற்ற இடங்களில் இருப்பு மற்றும் பணத்தை எண்ணுதல் போன்றவற்றிற்கு தேவையான கணித அறிவு. 3. புவியியல், சமூக மற்றும் பொருளாதார சூழல் 4. கடமைக்குரிய பொது அறிவு மற்றும் திணைக்கள முன்னேற்றம் தொடர்பான திறன் மேம்பாட்டு உத்திகள்

3. **தகமையை மதிப்பீடு செய்யும் நேர்முகப் பரீட்சை**

புள்ளிகள் வழங்கப்படும் பிரதான தலைப்புகள்	ஆகக்கூடிய புள்ளி	சித்தி பெறுவதற்கான புள்ளி
சேவை அனுபவம்	20	பொருத்தமற்றது
செயலாற்றுகை மதிப்பீடுகள்	20	
பெறப்பட்ட விதப்புரைகள் ➢ முந்தைய ஐந்து (05) ஆண்டுகளில் விசேட விதப்புரைகள் - 05 ➢ சாதாரண விதப்புரைகள் - 03	30	
இலட்சினைகள் பெறப்பட்டிருந்தால் (பச்சை 3 - புள்ளி 01, சிவப்பு 1 - புள்ளி 02, சிவப்பு 2 - புள்ளி 03, சிவப்பு 3- புள்ளி 4, தங்க இலட்சினை - புள்ளி 05)	05	
பதவி தொடர்பான பயிற்சி	10	
உயர் கல்வித் தகுதிகள் (டிப்ளோமா- புள்ளி 05 , 60 மணித்தியாலத்திற்கு மேற்பட்ட கற்கைநெறிக்கான சான்றிதழ் - புள்ளி 03)	05	
நேர்முகப்பரீட்சையில் வெளிப்படுத்தப்பட்ட திறன்கள்	10	
மொத்தம்	**100**	

4. **பதவி உயர்வு முறை:**

விண்ணப்ப முடிவுத்திகதியன்று மேலுள்ள பிரிவு 2 இன் கீழ் அனைத்து தகுதிகளையும் பூர்த்தி செய்யும் விண்ணப்பதாரர்கள் எழுத்துப் பரீட்சை மற்றும் நேர்முக பரீட்சை என்பவற்றின் முடிவுகளின் அடிப்படையில் தெரிவு செய்யப்படுவார்கள். எழுத்துப் பரீட்சை முதலில் நடத்தப்படும். எழுத்துப் பரீட்சையில் சித்தி பெறுபவர்களில் பதவி உயர்வுக்கு எதிர்பார்க்கப்படும் எண்ணிக்கையை விட மூன்று மடங்கானோர் நேர்முக பரீட்சைக்கு அழைக்கப்படுவார்கள். எழுத்துப் பரீட்சை மற்றும் நேர்முக பரீட்சை என்பவற்றில் பெற்ற மொத்த புள்ளிகளுக்கிணங்க பெற்றுக்கொண்ட நிலையின் அடிப்படையிலும் வெற்றிடங்களின் எண்ணிக்கைக்கமைவாகவும் மதுவரி சார்ஜன் பதவி உயர்வு வழங்கப்படும். எனினும் ஏதேனும் வெற்றிடங்களின் எண்ணிக்கை நிரப்பப்படாமை தொடர்பில் இலங்கை மதுவரித் திணைக்களத்தினால் தீர்மானிக்கப்படலாம்.

பரீட்சை திகதி - இந்த பரீட்சை 2024 மார்ச் மாதம் கொழும்பில் அமைந்துள்ள பரீட்சை நிலையமொன்றில் நடைபெறும். இந்த பரீட்சையை பிற்போடவோ அல்லது இரத்து செய்யவோ மதுவரி ஆணையாளர் நாயகத்திற்கு அதிகாரம் உள்ளது.

5. **தகுதிகூர் காலம்**

மதுவரி சார்ஜன் பதவிக்கு பதவியுயர்வு பெற்ற உத்தியோகத்தர்கள் ஒரு வருட காலத்திற்கு தகுதிகூர் நிலையில் வைத்திருக்கப்படுவர். தகுதிகூர் காலப்பகுதியில் பதவிக்குரிய கடமைகள், பொறுப்புகளை திறமையுடன் மேற்கொண்டு வினைத்திறன் மிக்க சேவையை நன்னடத்தையுடன் புரிவாராயின் தகுதிகூர் காலத்தின் இறுதியில் பதவியில் உறுதிசெய்யப்படுவர்.

6. **வினைத்திறன் தடைகாண்**

மதுவரி காவலர் பதவிக்கு ஆட்சேர்ப்பு செய்யப்பட்ட 10 வருடங்களில் அல்லது மதுவரி சார்ஜன் பதவிக்கு பதவியுயர்வு பெற்ற 03 வருடங்களில் இவற்றில் எது முதல் நடந்தாலும் இரண்டாவது வினைத்திறன் தடைகாண் பரீட்சையில் சித்தியடைந்திருத்தல் வேண்டும்.

7. **சம்பள அளவு**

03/2016 ஆம் இலக்க அரச நிர்வாகச் சுற்றறிக்கையின் பிரகாரம் மதுவரி சார்ஜன் பதவிக்குரிய மாதாந்த சம்பள அளவுத்திட்டம் (RS 2 – 2016) ரூ.32,010-9x370-17x 495-43755/-ஆகும்.

8. விண்ணப்பிக்கும் முறை

இணைய(Online) வழி விண்ணப்பங்களை ஆங்கில மொழியில் மாத்திரம் பூர்த்தி செய்தல் வேண்டும். விண்ணப்பங்களை பூர்த்தி செய்ய முன்னர் பரீட்சைக்கு விண்ணப்பித்தல் தொடர்பான பொது அறிவுறுத்தல்களை (Common Instructions) தரவிறக்கம் செய்யவும். விண்ணப்பங்களை பூர்த்தி செய்யும்போது இவ்வறிவுறுத்தல்களைப் பின்பற்றவும்.

(i) மேலே 1 இல் குறிப்பிடப்பட்டுள்ள தகமைகளை 20.01.2021 க்குள் பூர்த்தி செய்யும் உத்தியோகத்தர்கள் இலக்கம் 1 ஐ தெரிவு செய்ய வேண்டும்.

(ii) மேலே 1 இல் குறிப்பிடப்பட்டுள்ள தகமைகளை 21.10.2022 க்குள் பூர்த்தி செய்யும் உத்தியோகத்தர்கள் இலக்கம் 2 ஐ தெரிவு செய்ய வேண்டும்.

(iii) நீங்கள் 2021 மற்றும் 2022 ஆம் ஆண்டுகளுக்கான வெற்றிடங்களின் கீழ் விண்ணப்பிக்க விரும்பினால், இலக்கம் தெரிவு 3 ஐ செய்ய வேண்டும்.

9. பரீட்சைக்கான கட்டணம் ரூ.1200/- ஆகும். பரீட்சைக்கான கட்டணம் செலுத்தும் போது, இணைய முறையில் பின்வரும் கட்டணக் கட்டணம்செலுத்தும் முறைகளில் மாத்திரம் செலுத்தப்பட வேண்டும். குறிப்பு - மேலே 8 (iii) இன் கீழான விண்ணப்பதார்கள் ஒரு பரீட்சைக்கான கட்டணத்தை மாத்திரம் செலுத்தினால் போதுமானது.

I. ஏதேனும் வங்கிக் கடன் அட்டையின் ஊடாக (Any Bank Credit Cards)

II. ஏதேனும் வங்கிப் பற்று அட்டையின் ஊடாக (Any Bank Debit Cards)

III. இலங்கை வங்கியின் ஒன்லைன் பாங்கிங் முறைமை (Bank of Ceylon Online Banking Method)

IV. ஏதேனும் இலங்கை வங்கிக் கிளையின் ஊடாக (Bank of Ceylon Teller Slip Payment)

விண்ணப்பங்களை கையேற்றல் 2024 ஜனவரி 01 ஆம் திகதி முதல் 2024 ஜனவரி 31 ஆம் திகதி நள்ளிரவு, 12.00 மணி வரை இடம்பெறும். சமர்ப்பிக்கப்பட்ட விண்ணப்பத்தில் ஏதேனும் திருத்தம் செய்ய வேண்டியிருப்பின் அதற்காக விண்ணப்பத்தைக் கையேற்கும் இறுதித் தினத்திலிருந்து மூன்று நாட்கள் இணைய(online) வசதி வழங்கப்படும்.

குறிப்பு:- மேற்படி முறை ஊடாக பணம் செலுத்தும் வழிமுறை பற்றிய அறிவுறுத்தல்கள் இணையத்தளத்தில் பரீட்சைக்குரிய தொழில்நுட்ப அறிவுறுத்தல்களின் கீழ் பிரசுரிக்கப்பட்டுள்ளது.

கொடுப்பனவு கிடைத்தமை பற்றி குறுஞ்செய்தி ஊடாக அறிவிக்கப்படும். பரீட்சைக்குரிய முழுத்தொகையும் செலுத்தப்பட வேண்டியதுடன், குறைவாகவோ அதிகமாகவோ பரீட்சைக் கட்டணம் செலுத்தப்பட்ட விண்ணப்பங்கள் நிராகரிக்கப்படும். மேலே குறிப்பிட்ட கொடுப்பனவு முறை ஊடாக பரீட்சைக் கட்டணம் செலுத்துகையில் ஏற்படும் வழுக்கள் தொடர்பில் பரீட்சைத் திணைக்களம் பொறுப்பேற்காது.

10. வர்த்தமானி அறிவித்தலில் குறிப்பிட்ட தகைமைகளை உடையவர்களிற்கு மாத்திரம் விண்ணப்பத்தைக் கையேற்கும் இறுதித் திகதிக்கு அல்லது அதற்கு முன்னர் உரிய பரீட்சைக் கட்டணத்தைச் செலுத்தி பெற்றுக்கொண்ட பற்றுச்சீட்டுடன் சரியாகப் பூரணப்படுத்திய விண்ணப்பதாரர்களிற்கு பரீட்சைகள் ஆணையாளர் நாயகத்தினால் அனுமதி அட்டைகள் வழங்கப்படும். அனுமதி அட்டைகள் வழங்கப்பட்ட உடனேயே இலங்கைப் பரீட்சைகள் திணைக்களத்தினால் அறிவிப்பு வெளியிடப்படும். அனுமதி அட்டை கிடைக்கப் பெறாத விண்ணப்பதாரர்கள் அறிவித்தலில் குறிப்பிடப்பட்டுள்ளவாறு அது பற்றி இலங்கைப் பரீட்சைகள் திணைக்களத்தின் நிறுவனம்சார் பரீட்சைகள் அமைப்புப் பிரிவில் விசாரித்தறிதல் வேண்டும். அவ்விசாரணையில் பரீட்சையின் பெயர், விண்ணப்பதாரியின் முழுப் பெயர், தேசிய அடையாள அட்டை இலக்கம், முகவரி என்பவற்றைச் சரியாகக் குறிப்பிடல் வேண்டும். கொழும்பிற்கு வெளியே விண்ணப்பதாரி இருப்பின் இவ்விபரங்களுடன் பக்ஸ் மூலமாக அனுமதி அட்டையின் பிரதியை அனுப்பும் பொருட்டு விண்ணப்பதாரியின் பக்ஸ் இலக்கத்தையும் குறிப்பிட்டு வேண்டுகோள் கடிதத்தை அறிவித்தலில் குறிப்பிட்ட பக்ஸ் இலக்கத்தின் ஊடாக பரீட்சைத் திணைக்களத்திற்கு அனுப்பி வைத்தல் இது பற்றிய விசாரணையை மேலும் இலகுவானதாக்கும். மேலும், பரீட்சைத் திணைக்களத்தால் கேட்கப்பட்ட ஏதேனும் தகவல்களை சான்றுப்படுத்துதற்கு விண்ணப்பதாரியிடமுள்ள விண்ணப்பத்தின் பிரதி, பரீட்சைக் கட்டணத்திற்கான பற்றுச்சீட்டின் பிரதி, பதிவுத் தபாலில் அனுப்பியதற்கான பற்றுச்சிட்டை என்பவற்றை வைத்திருத்தல் பயனுள்ளதாகும்.

பரீட்சை விண்ணப்பத்தின் பிரதி விண்ணப்பதாரரால் அவரது தனிப்பட்ட கோவையில் உட்சேர்ப்பதற்காக சம்பந்தப்பட்ட அதிகாரிகளிடம் சமர்ப்பிக்கவேண்டும். மேலும் நிறுவனத்தின் தலைவரால் சான்றளிக்கப்பட்ட விண்ணப்பத்தின் பிரதி மற்றும் சேவையை நிரூபிப்பதற்கான கடிதம் ஆகியவை நேர்முகப்பரீட்சைக்கு அழைக்கப்படும்போது சமர்ப்பிக்கபட வேண்டும்.

விண்ணப்பதாரரிற்கு அனுமதி அட்டையை வழங்குதல், அவர் பரீட்சைக்கு அல்லது பதவிக்கு தகுதியானவரென ஏற்றுக்கொண்டதாகக் கருதப்பட முடியாது.

பரீட்சைக்குத் தோற்றும் முதலாம் தினத்தன்று பரீட்சை நிலையப் பொறுப்பதிகாரியிடம் தமது கையொப்பத்தை சான்றுப்படுத்திய அனுமதி அட்டையைக் கையளித்தல் வேண்டும்..

11. பரீட்சார்த்தி, பரீட்சை மண்டபத்தில் தோற்றும் சகல பாடங்களின் பொருட்டும் பரீட்சை நிலையப் பொறுப்பதிகாரி திருப்தியுறும் வகையில் தமது ஆளடையாளத்தை உறுதிப்படுத்துதல் வேண்டும். அதன் பொருட்டு பின்வரும் ஆவணங்களில் ஒன்று ஏற்றுக்கொள்ளப்படும்.

I. தேசிய அடையாள அட்டை
II. செல்லுபடியான வெளிநாட்டு கடவுச்சீட்டு
III. செல்லுபடியான இலங்கை சாரதி அனுமதிப்பத்திரம்

மேலும் பரீட்சார்த்திகள் தமது ஆளடையாளத்தை எண்பிக்கும் வகையில் முகம் மற்றும் காதுகளை மூடாது பரீட்சை மண்டபத்தில் நுழைதல் வேண்டும். ஆளடையாளத்தை நிரூபிக்காத விண்ணப்பதாரிகள் பரீட்சை மண்டபத்தினுள் நுழைய அனுமதிக்கப்படமாட்டார்கள். மேலும், பரீட்சை மண்டபத்தினுள் நுழைந்த தருணத்திலிருந்து பரீட்சை முடிந்து வெளியேறும் வரை பரீட்சை அதிகாரிகள் பரீட்சார்த்தியை அடையாளங் காணும் வகையில் முகத்தையும் காதுகளையும் மூடாது இருத்தல் வேண்டும்.

12. பரீட்சையை நடத்துதல், பெறுபேற்றை வெளியிடுதல் தொடர்பில் பரீட்சைகள் ஆணையாளர் நாயகத்தால் விதிக்கப்படும் சட்ட ஒழுங்குவிதிகளிற்கு பரீட்சார்த்திகள் கட்டுப்படுதல் வேண்டும். இச்சட்ட ஒழுங்குவிதிகள் மீறப்படின், பரீட்சைகள் ஆணையாளர் நாயகத்தால் விதிக்கப்படும் தண்டனைக்கு ஆளாக நேரிடும்.

13. சிங்கள், தமிழ், ஆங்கில மொழிகளில் பிரசுரிக்கப்படும் இவ்வறிவித்தலில் ஏதேனும் மொழிப் பிழை அல்லது உடன்பாடின்மை காணப்படுமிடத்து சிங்கள மொழி அறிவித்தலின் பிரகாரம் நடவடிக்கை எடுக்கப்படும்.

ஜே. எம். எஸ். என். ஜயசிங்ஹ
மதுவரி ஆணையாளர் நாயகம்

අයදුම්පත් අංක 01 2021 (2023 වර්ෂය)

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ

සුරාබදු සැරයන් තනතුරට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2023

මාධ්‍යය

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

නගරය	නගර අංකය

1.1 විභාගයට පෙනී සිටින මාධ්‍යය

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(උපලේඛනය 1 බලන්න)

1. (i)සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්): .....
   (ii)සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): .....
   (iii)මුලකුරු සමග නම: .....
   (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): .....
   (ii)ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .....
   (iii)ග්‍රාම නිලධාරි කොට්ඨාසය : .....
   (vi)තැපැල් ලිපිනය: .....
   (විභාග ප්‍රවේශ පත්‍ර එවීම සඳහා)

3. ස්ත්‍රී / පුරුෂභාවය :-

   පුරුෂ - 0
   ස්ත්‍රී - 1

   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ජංගම දුරකථන අංකය :

6. උපන් දිනය :
   ..... දිනට වයස : අවුරුදු : ..... මාස : ..... දින: .....

7. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :.....
   (පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග සඳහන් කරන්න)

8. ජාතිය : .....

9. විවාහක ද/ අවිවාහක ද යන වග:.....

10. සුරාබදු සැරයන් වරයකු ලෙස පත් වූ දිනය
    .....

11. සේවයේ ස්ථිර කරන ලද දිනය
    .....

12. සේවා ස්ථානය :.....

13. සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඩුවම් පිළිබඳ විස්තර
    .....
    .....

14. විභාග නිවේදනයේ අංක 1 යටතේ සුදුසුකම් සපුරන දිනය -.....

15. විභාග ගාස්තු පිළිබඳ විස්තර:

I. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය : .....

II. ලදුපත් අංකය හා දිනය : .....

III. ගෙවූ මුදල : .....

ලදුපත මෙහි අලවන්න (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

16. අයදුම්කරුගේ ප්‍රකාශය

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද, ප්‍රකාශ කරමි. අදාළ විභාග ගාස්තුව ගෙවූ බවද ප්‍රකාශ කරමි.

දිනය .....

.....

අයදුම්කරුගේ අත්සන

අයදුම්පත් අංක 2 2022 (2023 වර්ෂය)

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ

සුරාබදු සැරයන් තනතුරට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2023

මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.2 විභාගයට පෙනී සිටින මාධ්‍යය

සිංහල - 1

දෙමළ - 2 ☐

ඉංග්‍රීසි - 3

නගරය	නගර අංකය

(උපලේඛනය 1 බලන්න)

1. (i)සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්): .....
   (ii)සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): .....
   (iii)මුලකුරු සමග නම: .....
   (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): .....
   (ii)ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .....
   (iii)ග්‍රාම නිලධාරී කොට්ඨාසය : .....
   (vi)තැපැල් ලිපිනය: .....
   (විභාග ප්‍රවේශ පත්‍ර එවීම සඳහා)

3. ස්ත්‍රී / පුරුෂභාවය :-

   පුරුෂ - 0 ☐

   ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ජංගම දුරකථන අංකය :

6. උපන් දිනය :
   ..... දිනට වයස : අවුරුදු : ..... මාස : ..... දින: .....

7. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :.....
   (පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග සඳහන් කරන්න)

8. ජාතිය : .....

9. විවාහක ද/ අවිවාහක ද යන වග:.....

10. සුරාබදු සැරයන් වරයකු ලෙස පත් වූ දිනය
    .....

11. සේවයේ ස්ථිර කරන ලද දිනය

    .....

12. සේවා ස්ථානය :.....

13. සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඩුවම් පිළිබඳ විස්තර .....

    .....

14. විභාග නිවේදනයේ අංක 1 යටතේ සුදුසුකම් සපුරන දිනය -.....

15. විභාග ගාස්තු පිළිබඳ විස්තර:

I විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය : .....

II ලදුපත් අංකය හා දිනය : .....

III ගෙවූ මුදල : .....

ලදුපත මෙහි අලවන්න (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

16. අයදුම්කරුගේ ප්‍රකාශය

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද, ප්‍රකාශ කරමි. අදාළ විභාග ගාස්තුව ගෙවූ බවද ප්‍රකාශ කරමි.

දිනය .....

.....

අයදුම්කරුගේ අත්සන